අප භාවිතා කරනා භාෂාව තුළ, වර්තමානයේදී භාවිතා කළ යුතු දැයි දෙවරක් සිතිය යුතු යෙදුම් ඇතැම් විට හමුවේ. ඊට උදාහරණ ලෙසින් "දූෂණය" වැනි යෙදුමක් දැක්විය හැක. නීති පොත් වලද තවමත් ලිංගික අපරාධයක් හැඳින්වීම සඳහා දූෂණය යන්න යෙදුණත්, ඒ හා බැඳි සමාජ ගර්හාව සහ කොන් කිරීමේ ආකල්පය නිසා "දූෂණය" හෝ "කෙලෙසීම" වැනි යෙදුම් මාධ්‍ය තුළ භාවිතා කිරීම අයෝග්‍ය යැයි පැවසීමට සිදුවේ. දූෂණය හෝ කෙලෙසීම යන යෙදුම් ඔස්සේ වින්දිතයෙකු අපවිත්‍ර වී ඇතැයි ගම්‍ය වීම එම ඍණාත්මක සමාජ ආකල්පයට රුකුල් දෙයි.
එනිසා, දූෂණය හෝ කෙලෙසීම වැනි යෙදුමක් වෙනුවට වඩාත් යෝග්‍ය වන්නේ ලිංගික අපරාධය යන්න හෝ බාලවයස්කාර වින්දිතයෙකු සම්බන්ධයෙන් නම් ලිංගික අපයෝජනය යන්න වේ.

#MediaEthicsSL #lka #SinhalaPress #Aruna #Divaina